සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය
சமூகவலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

# දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
# வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
# Department of Divineguma Development

1වනඅධියර, 4වන මහල ,සෙත්සිරිපාය ,බත්තරමුල්ල.
1ம் கட்டம்,4வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல
1stStage , 4th floor, Sethsiripaya ,Battaramulla

මගේ අංකය / எனதுஇல / My No: DDD/HO/07/SD/18 /WEF
ඔබේ අංකය / உமது இல / Your No: ........................
දිනය / திகதி / Date: 2017.02.06

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්

සියළුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන්,

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්.

<u>වස විස නැති ආහාර පරිභෝජනය සඳහා සමාජයේ පවතින අධික ඉල්ලුම</u>

අතිගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමාගේ සංකල්පයකට අනුව 2017 වර්ෂය දිළිඳුකම පිටුදැකීමේ වර්ෂය ලෙස ප්‍රකාශයට පත් කර ඇත. රජය විසින් තිරසර සංවර්ධන ඉලක්ක අනුව යමින් අප රටට අදාළව "තිරසර සංවර්ධන මෙහෙවර" ප්‍රකාශයට පත් කර ඇත.

02. ඒ අනුව දිළිඳුකම පිටුදැකීම හා සමාජ සවිබල ගැන්වීමට අදාළ විෂය කටයුතු මූලිකවපැවරී ඇති දෙපාර්තමේන්තුව වශයෙන් දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව සමෘද්ධි ප්‍රතිලාභ ලබන පවුල් සවිබල ගැන්වීම සඳහා 2017 වර්ෂයේදී ඉහළම ප්‍රමුඛතාවයක් දී වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ.

03. දැනට අපේ රටේ කෘෂිකාර්මිකහා ආර්ථික රටාව තුළ රසායනික පොහොර හා කාමිනාශක භාවිතය හා එමඟින් නිෂ්පාදනය වන ආහාර පරිභෝජනය කරනු ලැබේ. මෙම ආහාර පරිභෝජනය තුළින් විවිධ ලෙඩ රෝග වලට ගොදුරු වීමත් එමඟින් ජනතාවගේ කායික, මානසික මෙන්ම ආර්ථික ශක්තියද පිරිහීමට පත්ව ඇති අතර මෙය සමාජ උවදුරක් බවට පත්ව ඇත. මෙම තත්වය මත දැනට මහත් ව්‍යසනයක්ව පවතින බෝ නොවන රෝග පැතිරීම වැලැක්වීමට රජය විසින් වස විස වලින් තොර වගාව පිළිබඳ සංකල්පය රජයේ ප්‍රධාන වැඩපිළිවෙලක් ලෙස ක්‍රියාත්මක වන අතර මේ සම්බන්ධව මහා කතිකාවක් රට තුළ නිර්මාණය වී ඇත. එබැවින් මෙම සමාජ උවදුර මැඩලීම සඳහා සුදුසු වැඩපිළිවෙලක අවශ්‍යතාවය දිවයිනේ සෑම ප්‍රදේශයකින්ම මතුවී ඇති අතර එයට පිළියමක් ලෙස වස විස නැති ආහාර නිෂ්පාදනය, පරිභෝජනය ඒ සඳහා ආහාර බොජුන්හල් ඇති කිරීම වැනි කාර්යයන් පිළිබඳව විශේෂ අවධානය යොමු කිරීම කාලීන අවශ්‍යතාවයක් බව නිරීක්ෂණය කරමි.

04. ඒ අනුව දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කිරීමට යෝජිත 2017 සංවර්ධන සැලැස්මේ කාන්තා සවිබල ගැන්වීමේ වැඩසටහන් සඳහා වැඩි ඉඩ කඩක් වෙන් කරමින් බෝ නොවන


| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂජනරාල් / மேலதிகபணிப்பாளர்தலைமையதிபதி / Additional DirectorGeneral | අධ්‍යක්ෂ(පාලන) / பணிப்பாளர்(நிர்வாகம்) / Director (Administration) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|
| Tel- | 2-011873802/2872202 | 011-2871672 | 011-2873799 | 011-2887280 |
| Fax - | 2-011889002 | 011-2887280 | 011-2873996 | **011- 2887722(Hotline)** |
| E-mail- | dg@divineguma.gov.lk | adg@divineguma.gov.lk | diradmin@divineguma.gov.lk | |

රෝග වලින් පීඩා විඳිනු ලබන සමස්ථ ප්‍රජාව ඉලක්ක කරගෙන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික්ක/ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල සමෘද්ධි බොජුන්හල් ආරම්භ කිරීමට ඇති හැකියාව පිළිබඳ ඔබගේ අවධානය යොමු කරවනු ලැබේ.

05. එහිදී සවිබල ගැන්වීමේ අරමුණු සඳහා කාණ්ඩ ගත කොට ඇති ප්‍රතිලාභී පවුල් කාණ්ඩ 03 න් ඉහළ ආදායම් මට්ටමේ කාණ්ඩය පිළිබඳව වැඩි අවධානයක් යොමු කිරීම වැදගත් වන අතර බොජුන්හල් ආරම්භ කිරීම ඉලක්ක කොට ආහාර නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍ය සපයන පවුල්, ආහාර ද්‍රව්‍ය සෞඛ්‍යාරක්ෂිතව පිළියෙල කරන පවුල්, එම නිෂ්පාදන සෞඛ්‍යාරක්ෂිතව අලෙවිකරන පවුල් වශයෙන් ක්‍රියාකාරකම් මුල්කරගෙන සුළු පරිමාන ව්‍යාපාර ජාලයක් බිහි කිරීම පිළිබඳවත් එමඟින් සමෘද්ධි පවුල් සවිබල ගැන්වීමේ අරමුණ කරා යාමට ඇති හැකියාවත් පිළිබඳ සොයා බැලීම වැදගත් වැදගත් වන බව අවධාරණය කෙරේ.

06.මෙම කාර්ය සාර්ථක කර ගැනීම සඳහා සහයෝගය ලබා ගත හැකි ආයතන ජාලයක් වන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, වෘත්තීය පුහුණු ආයතන සහ කාර්මික සංවර්ධන මංඩලය, කෘෂිකර්ම අභ්‍යාස පර්යේෂණ පුහුණු ආයතනය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ආහාර තාක්ෂණ හා නිෂ්පාදන අලෙවි අංශය වැනි ආයතන පද්ධතිය සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම කෙරෙහි ද ඔබගේ අවධානය යොමු කරමි.

07. දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අලෙවි අංශය මඟින් දිස්ත්‍රික් අලෙවිසැල් ආරම්භ කිරීම පිළිබඳ දැනටමත් ඔබ වෙත දැනුම් දී ඇති අතර එයට අමතරව මහජනතාවගේ වස විෂ වලින් තොර වූ ආහාර පරිභෝජනය සඳහා වැදගත් වන කාර්යයක් ලෙස ඔබගේ දිස්ත්‍රික්කය/ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ සමෘද්ධි බොජුන්හල් ආරම්භ කිරීම සඳහා ඇති හැකියාව පිළිබඳශක්‍යතා අධ්‍යයන වාර්තාවක් කඩිනමින් මා වෙත ලබා දීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

මේ සම්බන්ධයෙන් ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

නීල් හපුහින්න

අධ්‍යක්ෂ ජනරාල්

පිටපත :- සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන ගරු අමාත්‍ය එස්.බී.දිසානායක මහතා - කාරුණික අවධානය සඳහා